සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

# දෙවන වාර පරීක්ෂණය 2021
Second Term Test

**11 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** | **පැය එකයි**

**සැලකිය යුතුයි :**

**(i)** සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.

**(ii)** අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4), උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

**(iii)** ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

**(iv)** එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

**අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

1. කම්කරුවා තමන් වෙත පැවරූ කාර්යයන් **ඉස්පාසුවක් නොමැති වුවද,** දැඩි සතුටින් ඉටු කළේය.
(1) ඉක්මනින් (2) අවිවේකීව (3) නිහඬව (4) උද්යෝගයෙන්

2. මේ දරුවාට නම් **සෙනසුරා ලබා** ඇතැයි අම්මා නිතර පැවසුවාය.
(1) ඉවරයක් නොමැති කාලය (2) සෙනසුරාදා උපත ලබා
(3) අයහපත් කාලයක් උදා වී (4) යහපත් කාලයක් ලබා

3. කට්ටඩියා සිදුකළ ශාන්ති කර්මය **කිරිගහට ඇන්නා වගේ** සිදුවූ බව, ඔහු ආඩම්බරයෙන් ප්‍රකාශ කළේය.
(1) හරියටම සාර්ථක වීම. (2) අඩු පාඩුවක් නැතිවීම.
(3) කිළි නොමැතිව සිදුවීම. (4) අනෙක් අයට සෙත සැලසීම.

**අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

4. ප්‍රකාශනයකින් පාඨකයන් .................................. පත් වේ නම් එහි මාධුර්ය ගුණය ඇතැයි කිව යුතුය.
(1) සංවේගයට (2) සංතෘප්තියට (3) සංශයාර්ථයට (4) සාර්ථකත්වයට

5. මුද්‍රණ ශිල්පය පැමිණීමත් සමඟ පොත් පත් .................................................. ව්‍යාප්ත විය.
(1) පර්යේෂණ (2) ප්‍රචලිත වීම (3) ප්‍රදානය (4) ප්‍රකාශනය

6. කුඩා කල සිට ම ප්‍රශ්න කිරීමට හා විමසීමට තිබූ රුචිය ඔහුගේ බුද්ධි ............................ පදනම විය.
(1) ස්වාධීනත්වයේ (2) ප්‍රවීණත්වයේ (3) ප්‍රබෝධයේ (4) ප්‍රවේශයේ

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) වෘද්ධ, ප්‍රදර්ශණය, අවමාණ, අන්‍යායතා (2) සංකලනය, ප්‍රකාශණ, වර්දන, විශ්වාස
(3) නිෂ්පාදන,වාර්ථාව, සම්ප්‍රධාය, ආස්වාදය (4) අනුවේදනීය, පිළිසඳර, ප්‍රතිග්‍රහණ, සංකෝචනය

8. රැල්ල, රිකිල්ල, රාවණා, රුවල, යන වචන වල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කෙටි ඇදපිල්ල, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල, කෙටි පාපිල්ල.
(2) කෙටි ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල, කෙටි ඇදපිල්ල.
(3) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, ඇදපිල්ල, කෙටි පාපිල්ල.
(4) ඇදපිල්ල, දිගු ඉස්පිල්ල, පාපිල්ල, කෙටි ඇදපිල්ල

9. අර්ථ සමාන කොටසක් සහිත යුගල පදයක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.

(1) ගොවියා තම කමතේ තිබුණු ලට්ටලොට්ට සියල්ල අස් කළේය. (2) එදින රැස්වීමට සමිතිසමාගම් රැසක් එක්ව තිබුණි.
(3) පාලකයා පඩිනඩි ගෙවීමට මුදල් රැගෙන ආවේය. (4) පාසල් දරුවන් සිරිත්විරිත් පුරුදු විය යුතුය.

10. අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) ගම්පහ, කෑගල්ල, මීරිගම, බදුල්ල. (2) අක්මීමන, නුවර, බණ්ඩාරවෙල, ගාල්ල.
(3) කොළඹ, දඹුල්ල, බලන්ගොඩ, මහනුවර. (4) අනුරාධපුර, කුරුණෑගල, කඩවත, රත්නපුර

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) කම්කරුවෙක්, දැරියක්, පාලකයෙකු, වෛද්‍යවරයෙක්. (2) වලහෙක්, මවක, දරුවෙකු, කුරුල්ලෙක්.
(3) රජෙකු, වහලෙක්, නරියෙක්, ගැහැණියක්. (4) ගුරුතුමියක, මිනිසෙකු, කාන්තාවන්, ගායිකාවක.

12. විනිසුරුතුමා පැමිණිලිකරුගෙන් මෙසේ ප්‍රශ්න කළේය.යන වාක්‍යයේ "පැමිණිලිකරුගෙන්" යන්නෙහි විභක්තිය කුමක්ද?
(1) අවධි විභක්ති (2) කරණ විභක්තිය (3) සම්බන්ධ විභක්ති (4) ආලපන විභක්ති

13. අනතුර දුටු ගම්වැසියෝ ඉක්මනින් එතැනට රැස්වූහ. මෙහි ඉක්මනින් යන පදය අයත් වන්නේ,
(1) නාම විශේෂණ (2) ක්‍රියා විශේෂණ (3) මිශ්‍ර ක්‍රියාවකි (4) ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි.

14. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
(1) සමාස - නිදොස් , ඉරහඳ, පරපටු, දිනකර. (2) නිපාත-තරම්, නීති, විනා ,හෙවත්
(3) අසම්භාව්‍ය ක්‍රියා - කල, නැගෙත්, කරතුදු, ගොස් (4) සන්ධි උනුන්, පුළුලුකුල, අත්‍යාවශ්‍ය, සහෝදර

15. තද්ධිත පදයක් යෙදී නැති වාක්‍ය කුමක් ද?
(1) මහලු මිනිසා තුනටියේ වේදනාවෙන් කෑ ගැසුවේය. (2) කුණාටුවට අසුවූ නැව නැවියන් සමග මුහුදු බත් විය.
(3) මල්ලී පාසල් නොයෑම ගැන තාත්තා දුක්විය. (4) ඔරුව මෙගොඩට පදින ලෙස ඔහු තොටියාට කීය.

16. වැරදි ලෙස සන්ධි කොට ඇති පදයක් ඇතුළත් වන්නේ කවර පිළිතුරෙහිද?
(1) ලෝකුත්තර, ගුණාංග, පංචාංග (2) අරුණෝදය, රුවනාර, මෙහෙසුරු
(3) පුනරාගමනය, ගොක්කොළ, සීමාසන්න (4) ප්‍රථමාධාර, රතුපුල්, උනුන්

**අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

17. ශාසන **චිරස්ථිතියට** සේවයක් සිදුවිය.
(1) අභිමතාර්ථය සඳහා (2) බොහෝ කාලයක් පැවතීමට
(3) යහපත් සැලසීමට (4) කීර්තියක් ලබා දීමට

18. වර්තමානයේ ඇසෙන ගීත **භාවපූර්ණ** නිර්මාණයන් විය.
(1) අර්ථවලින් තොර (2) සැනසීමකින් වෙන් වූ
(3)හැඟීම්වලින් සපිරුණු (4) සම්පූර්ණ අර්ථයෙන් තොර

19. ඔහුගේ **ශාස්ත්‍රධරත්වය** අගය කළ යුතුවේ.
(1) දැනුමින් සපිරීම (2) කාර්යක්ෂම බව
(3) දැනුමට ගරු කිරීම (4) ශාසනික සේවය

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය ඇතුළත් වරණය වන්නේ,
(1) පොත, පැන්සල, පෑන, මකනය (2) අල්මාරිය, පුටුව, මේසය, බංකුව
(3) කේතලය, පිහිය, හිරමනය, කොරහ (4) උදැල්ල, පොරව, ඔරලෝසුව, කියත

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මුහුද - දලනිඳු, දද - කුරුල්ලා, හොඳ - නරක
(2) උචිත - යෝග්‍ය,ප්‍රීතිය - ප්‍රමෝදය, රළු - කටුක
(3) සුකුමාර - සිව්මැලි, උපහාසය - අපහාසය, ගුවන - ගගන
(4) පිළිමය - ප්‍රතිමාව, ප්‍රයත්නය - ආයාසය, යුවතිය - යෞවන

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) චංචල - ලෙල, සසල , සල, තනන (2) ප්‍රසිද්ධ - පවර, පුවතර, ප්‍රකට, පතළ
(3) භූමි - දෙරණ, මිහි, මී, ගිරි (4) ඇතා - ඇත්, ගජ, මතඟ, වරණ

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ආචාර - අනාචාර (2) අභිමුඛ - අනභිමුඛ
(3) ආකල - නිරාකල (4) උත්තර - පිළිතුර

24. වැරදි අදහස දෙන ප්‍රකාශනය තෝරන්න.

(1) අනුස්වාරය හා විසර්ගය දෙකින් අනතුරුව යෙදෙනුයේ ව්‍යඤ්ජනාක්ෂරයක් පමණි.
(2) "ඤ" වර්ගාන්ත අක්ෂරයක් වේ.
(3) "ෆ" අක්ෂරයට පිල්ලම් යොදන්නේ නැත.
(4) "ව" ඕෂ්ඨජ අක්ෂර කාණ්ඩයට වැටෙයි.

25. මුලින් දී ඇති ක්‍රියා වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) මිශ්‍ර ක්‍රියා - කඩමින්, ඉසිමින්, ලියමින්, වනවනා (2) අසම්භාව්‍ය ක්‍රියා - වනත්, පිසතොත්, නටමින්, කියත
(3) විධික්‍රියා - අවමැනවි, යව, එන්න, පනින්න (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා - හඬවයි, නටවයි, ලියවා, තබ්බවා

**අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

26. කළ නොහැකි දෙයක් කරන්නට උත්සහ කිරීම.

(1) රුපියල් අස්සේ අලුක්කාල් ගැහීම. (2) වක්කඩේ හකුරු හැංගුවා වගේ
(3) බළලුන් ලවා කොස් ඇට බෑවීම. (4) ඉදිකටු තුඩේ තපස් රකින්න ගියා සේ

27. අවුල් වූ තැන තව තවත් අවුල් ඇති කිරීම.

(1) ඇවිලෙන ගින්නට පිදුරු දැමීම වගේ (2) වඳින්න ගිය දේවාලෙ හිස මත කඩා වැටීම වගේ
(3) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්න වගේ (4) ගින්නක් නැතිව දුමක් නොනැගෙන්නා වගේ

28. ගාත්‍රාක්ෂර ලෝප සන්ධියට හා ස්වර සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) සුණුවම්, දැවුරුදු (2) නළහන, පැහැති
(3) අස්සන, සිහිනය (4) ගම්පොළ, පිනැත්තෝ

**අංක 29 ,30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

29. (1) වඳුරෙකු සමග මිත්‍ර වී සිටි ඇතෙකු බුදුන්ට උවටැන් කළේය.

(2) ගුරුවරු හා ශිෂ්‍යයන් රැස්වීමට ආහ.

(3) අපි යෝධයෝ සේ හැසිරෙමු.

(4) නිළියක රැඟුමක් පාති'යි ප්‍රේක්ෂකයෝ අපේක්ෂා කළහ .

30. (1) කොටි රළ වනය දෙවනත් කරති. (2) සමහරුන් විශ්ව විද්‍යාලයට යති.
(3) මල් පොකුරු සුවඳ විහිදුවති. (4) අසෝක රජතුමා දැහැමි පාලකයෙකු විය.

31. (1) වෙරළ ................ රළ විහිදුණේය.
(2) ඔය ................ හිතුවක්කාර වැඩ කරන්න එපා.
(3) ඔහු මොන ...................... ධනයක් නාස්ති කළේ ද?
(4) සුන්දර යුවතිය රෝගයෙන් අසාධ්‍යම මිලාන වූ කුසුමක් ..................... දිස් විය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද ?

(1) දක්වා, වගේ, තරම්, මෙන් (2) දක්වා, තරම්, වගේ, මෙන්
(3) මෙන්, වගේ, තරම්, දක්වා (4) දක්වා, මෙන්, තරම්, වගේ

32. පහත දැක්වෙන යෙදුමේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
" පැසුණු හිසින් බුහුමන් ලබව"
(1) වෘද්ධ භාවයට පත් වූ විට බුහුමන් ලබන බව. (2) හිසකෙස් පැසුණු විට ගරුසරු දැක්වීම සිරිතක් බව.
(3) බුහුමන් ලැබිය හැක්කේ පැසුණු කෙස් ඇත්තාට බව. (4) නැණ නුවණ වැඩි උගතා බුහුමන් ලබන බව.

33. පහත සඳහන් කවි දෙපදයේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
" තඹුරු වනය මුකුලිතවන බව සවස
කවුරු විසින් වැළකිය හැකි මෙදිය කුස"

(1) නෙළුම්වනය සවස පරවීම කලාතුරකින් සිදුවේ.
(2) සවස් කාලයේ නෙළුම් පරවීම කාටවත් වැළකිය නොහැකි.
(3) සවස නෙළුම් පරවීම ස්වභාව ධර්මයේ ක්‍රියාවලියකි.
(4) සවස නෙළුම් පරවීම වැළැක්විය හැක්කේ ඉතා අමාරුවෙනි.

34. පහත සඳහන් කවියේ හතරවන පදය දැක්වෙන වරණය තෝරන්න.
" පෙර දැක නොමැති මුත් සුන්දරහාමි විසින්
මගේ තොරතුරු ඇසූ සැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
......................................................................................"
(1) එනවා දුටිමි මිටි බැඳාගත වියළි දර (2) දුන් සත පනහවත් නැත ඔහු පිළිගත්තේ
(3) සුන්දරහාමි එතරම් පොහොසතෙකු නොවේ. (4) පිළිගැන්වී ය මට සොම්නස පිරුණු ඇසින්

35. " සිනා කුමාරි" පද්‍ය රචකයා වන්නේ
(1) චන්ද්‍රරත්න මානවසිංහ ය (2) මහගම සේකරය.
(3) මොනිකා රුවන්පතිරණ ය (4) ජී.බී. සේනානායක ය.

36. "අහසේ අඳුරු පැහැ වැහි කළු නගින කොට
සුළගේ වෙනස මෙහි ගහකොළ කියන කොට" ඉහත පද්‍ය කොටසේ අර්ථය වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ.
(1) තද වැස්සක් ආසන්නව ම ඇති බව. (2) අඳුර පැතිරෙන් ම සුළඟේ වේගය අඩුවැඩි වන බව.
(3) සුළඟත් සමඟ අහස වැහි වලාකුළුවලින් වැසී ගිය බව. (4) සුළගේ ප්‍රමාණය ගහකොළ සෙලවීම අනුව කිවහැකි බව.

37. වතුර මල කෙටි කතාවේ කතුවරයා වන්නේ
(1) ගුණදාස අමරසේකර ය (2) ඇරැව්වල නන්දි මිත්‍ර ය
(3) සිරි ගුණසිංහ ය (4) රැපියෙල් තෙන්නකෝන් ය

38. ප්‍රාදේශික උප භාෂා යටතේ "හේමලයා" යන්නෙහි පොදු වහර වන්නේ,
(1) මස්සිනා (2) හේන් ගොවිතැන (3) සෙවනැල්ල (4) හොල්මන් කිරීම.

39. ධීවර කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී "පන්න කරනවා" යනු
(1) මසුන් මැරීම ය. (2) උපකරණ යෙදීම ය
(3) මාළු වෙළඳාම් කිරීම ය. (4) පනමකට ලබාදීම ය.

40. "කවි කලාවේ සේවය ස්වභාව සෞන්දර්යයත් මිනිසාත් අතර පරතරය අඩුකොට ඔවුනොවුන් මුණගැස්සීමය."
ඉහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර වන්නේ
(1) මිනිසා ස්වභාවයෙන් ම ස්වභාව සෞන්දර්යයට අකමැතිය.
(2) මිනිසා ස්වභාව සෞන්දර්යයේ රස වින්දනයට පුරුදු කිරීම කවියේ පරමාර්ථයකි.
(3) කවි අගය නොකරන්නා ස්වභාව සෞන්දර්යය අගය නොකරයි.
(4) කවියේ ප්‍රධාන සේවය ස්වභාව සෞන්දර්යය ඇගයීම ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## දෙවන වාර පරීක්ෂණය 2021
## Second Term Test

**11 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** | **පැය දෙකයි**

**(i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් එක් එක් වචනවල අන්තර්ගත පිල්ලම් අනුපිළිවෙළින් ලියන්න.
(අ) සැරසූ (ආ) කුමාරී

(ii) පහත සඳහන් නාම පදවල ප්‍රකෘති වෙන් කර ලියන්න.
(අ) මහල්ලා (ආ) පහන

(iii) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් ඌෂ්මාක්ෂර දෙකක් ලියන්න.

(iv) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා ලියන්න.
හොඳ සෞඛ්‍ය පුරුදු අනුගමනය කර උපද්‍රවවලින් මිදෙන ආකාරය, ජනතාවට පහදා දීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු අපමණ වෙහෙසක් ගනිති.

(v) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
(අ) උඩඟු බවක් නැති (ආ) හිරු උදාවට පෙර පැතිරයන ආලෝකය

(vi) පහත දැක්වෙන කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
(අ) කම්කරුවන් විසින් වැඩ කරනු ලබයි.
(ආ) අප විසින් පිට්ටනියේ තණ කන එළදෙනක් දකිනු ලැදී.

(vii) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරින් මුද්‍රිත** පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) **අස** දැන් තා යන මඟ සලකුණු මෙතැන් සිට
(ආ) වනන්තරේ වන සපු මල් **පිපීයන්**

(viii) පහත දැක්වෙන පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.
(අ) දෙ + අවුරුදු (ආ) වජ් + කඩ

(ix) පහත සඳහන් වාක්‍යවල **තද කළු අකුරින් මුද්‍රිත** පදවල සමාස වර්ගය ලියන්න.
(අ) දැරිය **සුමිහිරි** ගීතයක් ගැයුවාය.
(ආ) ජංගම දුරකථනය **ජනප්‍රිය** මෙවලමක් වී ඇත.

(x) පහත සඳහන් වාක්‍යවල **තද කළු අකුරින් මුද්‍රිත** පදවල විභක්තිය ලියන්න.
(අ) වෛද්‍යවරු **රෝගීන්ට** එන්නත් ලබා දෙති.
(ආ) **දරුවනි**, යහපතෙහි හැසිරෙන්න. (ලකුණු 02 × 10 = 20යි)

2. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) පෙරදිග ධාන්‍යාගාරය යන විරුදාවලියලත් ශ්‍රී ලංකාව අතීතයේ සිට කෘෂිකර්මාන්තයේ උසස් තැනක පැවතිණි. කෘෂි වගාවන් සඳහා කාබනික පොහොර භාවිතයට හුරු වූ එදා ගොවියා වස විස නැති ආහාර රටාවකට ජනයා යොමු කළේ ය. අද කෘෂි රසායන හා රසායනික පොහොර මිනිසාගේ ජීවිතයට සෘජුවම හා වක්‍රව එල්ල කරන තර්ජන බොහෝය. කාබනික පොහොර භාවිතයට කෘෂිකර්මාන්තය යොමු කිරීම කලෝචිත වේ.

(ආ) ලොවම කොවිඩ් 19 නම් දරුණු රෝගයට මුහුණ දී තිබේ. දෛනික ජීවිතවලට සිදුකළ විපර්යාසය සුළු පටු නොවේ. අප රටේ ආර්ථිකයට එල්ල කළේ ද දරුණු පහරකි. මෙම ඛේදවාචකයෙන් මිදීමට නම් එකිනෙකා තම සෞඛ්‍යය සුරක්ෂිත බව මනාසේ අවබෝධ කර ගැනීමත් එදිනෙදා කටයුතුවලදී කෙසේ සැලකිලිමත් විය යුතු ද යන්න අවබෝධ කරගත යුතුය. නීතියක් නොව තම පැවැත්මක් යන ආකල්පය තුළින් වසංගතය පිටු දකිමු.

(ඉ) විවිධ නාට්‍ය වර්ග අතර ටෙලි නාට්‍ය ජනප්‍රිය වෙමින් පවතී. ළමයින්ගේ අධ්‍යාපනයට හා සදාචාරාත්මක වර්ධනයට ද ටෙලි නාට්‍ය බලපාන ආකාරය සැලකිල්ලට ගත යුත්තකි. වෙළඳ ව්‍යාපාරිකයා හා ටෙලි නාට්‍ය අතර ඇති සම්බන්ධය රටේ අනාගත පරපුරේ ගුණාත්මක වර්ධනයට පහරක් නොවිය යුතුය. උසස් වින්දන ශක්තියක් ජනතාව තුළ ඇතිවන පරිදි නාට්‍ය නිෂ්පාදනය වැදගත් ය.

(ඊ) ශ්‍රී ලංකාවේ ඓතිහාසික හා සංස්කෘතික වටිනාකම් පිළිඹිබු කෙරෙන අංග ලෙස ස්තූප, ප්‍රතිමා, සඳකඩ පහණ හා බිතු සිතුවම් යනාදි කලා නිර්මාණ කැපී පෙනේ. ස්වාභාවික බලපෑම් හා මානව ක්‍රියාකාරකම් හේතු කොටගෙන විනාශයට ළගාවෙමින් පවතින මෙබඳු ජාතික සම්පත් සුරක්ෂිතව තබාගැනීමට පියවර ගැනීම අවශ්‍යවේ. රටේ අනන්‍යතාව මේ තුළින් මතුවීම ජාතියක් ලෙස ඇත්තේ ආඩම්බරයකි.

(ලකුණු 25 යි)

03. පහත දැක්වෙන පාඨ්‍ය වචන 65 - 75 අතර වන සේ සාරංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

කණිෂ්ක රජතුමාගේ අනුග්‍රහය පරිදි සංගායනා වූ ධර්ම ග්‍රන්ථ ශිලාමය මංජුසාවල අසුරා රජු විසින් ම කරන ලද ස්තූපයක නිදන් කරන ලදි. කාශ්මීරය මහා සංඝරත්නයට පූජා කිරීම කණිෂ්ක රජුගේ සැදැහැති බව පෙන්නුම් කරන්නකි. තමාගේ නමින් කණිෂ්කපුර ලෙස නගරයක් කරවා කණිෂ්ක නමින් ස්තූපයක් ද කරවන ලදි.

මෙම ස්තූපය ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ අතින් උසස්ම තත්ත්වයේ පැවතුණි. කණිෂ්ක මහා විහාරය නමින් විහාරාරාමයක් ද ඉදිකළේ ය. කණිෂ්ක රජතුමා තම රාජ්‍ය දේශ සීමාවෙහි සෑම නගරයක් ආශ්‍රිතවම මහා ස්තූප හා ආරාම තනවන ලදී. මේ පිළිබඳව චූවැන් චැනි චීන දේශාටක වාර්තාකරුවන්ගේ ලියමන් හි දැක්වේ.

ධර්ම ශාස්ත්‍රීය සේවයෙහි නිරත වූ ලේඛකයන්ට රාජ්‍ය අනුග්‍රහ ලබා දුන්නේ ය. මේ නිසා විද්වත්හු බොහෝ පොත් පත් රචනා කළහ. ඒ අතර අශ්වඝෝෂ, වසුමිත්‍ර, පාර්ශව, නාගර්ජුන වැනි පඬිවරු බුදු දහම ආශ්‍රිතව වටිනා කෘති රචනා කළහ.

රජතුමා බුදු දහම දේශිය විදේශීය වශයෙන් ප්‍රචාරය කිරීමට කටයුතු කරන ලදි. මධ්‍යම හා පෙරදිග ආසියාතික රාජ්‍යයන්ට බුදු දහම හඳුන්වා දීමත්, භාරතයේ මධ්‍යදේශයේ සිට මධ්‍ය ආසියාව දක්වා තම රාජ්‍ය සීමාවේ බුදු දහම ප්‍රචාරය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළේය.

වෙහෙර විහාර තැනූ අතර ඒවායෙහි අලංකාරවක් කැටයම් ශිල්ප මගින් ඔපවත් කර තිබිණි. බුදු පිළිමය ප්‍රථම වතාවට ලොවට බිහිවන්නේ කණිෂ්ක රාජ්‍ය සමයේ දී ය. (ලකුණු 10යි)

04. පහත දැක්වෙන ජේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

නූතන කවිහු විවිධ කාව්‍ය ආකෘතීන් ප්‍රයෝජනයට ගනිති. ඒ අතර පැරණි කාව්‍ය ආකෘතීන් යොදා ගැනේ. දෙපද කාව්‍ය ආකෘතිය, සිවුපද කාව්‍ය ආකෘතිය මෙහිදී ප්‍රධාන වේ. නිදහස්, නිසඳැස් කාව්‍ය ආකෘතිය නූතන කවියෝ බෙහෙවින් යොද ගනිති. ඒ අතර සැහැලි ආකෘතියට අනුව නිර්මාණ වූ පද්‍ය රචනා ද දැකිය හැකිය. කවර කාව්‍ය ආකෘතියක් යොදා ගැනුණත් කාව්‍ය සන්දර්භය විමසීමේ දී කවියා යොදා ගත් කාව්‍ය ආකෘතිය ඒ සඳහා මැනවින් ගැළපී ඇති බව පසක් විය යුතුය. පද්‍ය නිර්මාණයක විරිත, අනුප්‍රාස, ශබ්ද ධ්වනි, ලය ආදී ශබ්දාලංකාර යොදා ගනිමින් රසික සිත චමත්කාරයෙන් පුරවාලන නූතන කවියා යොද ගන්නා කාව්‍ය ආකෘති පද්‍ය නිර්මාණයට ආලෝකයකි. කවිය අපගේ හද බස වන අතර මෙවලම වනුයේ භාෂාවයි. කාව්‍ය රස විඳීම සඳහා මූලික වන්නේ භාෂා ඥානයයි. මෙහි දී අදහස් කරන්නේ පද්‍ය රසවින්දනය සඳහා භාෂාවේ හසළ දැනුමක් අවශ්‍ය වන බව නො වේ. චිත්‍ර ශිල්පියා වර්ණ හා රේඛා මෙන් ද සංගීතඥයා නාද මෙන් ද කවියා භාෂාවේ වචන තම නිර්මාණය සඳහා ආධාර කර ගනියි. "කවිය යනු හොඳම වචන හොඳම පිළිවෙළට යෙදීමයි" - එස්.ටී. කොල්රිජ් ප්‍රකාශ කළේ මේ නිසා ය.

(i) විවිධ කාව්‍ය ආකෘති අතර ප්‍රධාන කාව්‍ය ආකෘති දෙකක් දක්වන්න.
(ii) නූතන කවියෝ බෙහෙවින් යොදාගත් කාව්‍ය ආකෘති දෙකක් දක්වන්න.
(iii) පද්‍ය නිර්මාණයක විරිත, අනුප්‍රාසය, ශබ්දධ්වනි, ලය යනාදිය හඳුන්වන්නේ කුමන ආකාරයකට ද?
(iv) කවියාගේ මෙවලම කුමක් ද?
(v) කවිය පිළිබඳ "එස්.ටී. කොල්රිජ්" ප්‍රකාශ කළ නිර්වචනය කුමක් ද? (ලකුණු 02 × 5 = 10)

05. දුටුවැව ග්‍රාමයේ නැණසස තාක්ෂණික පුහුණු ආයතනයට සාමාජිකයින් බඳවා ගැනීම.

බඳවා ගැනීමේ කොන්දේසි කිහිපයක්

ග්‍රාම සේවක සහතිකය අනිවාර්යවේ, මව/පියා භාරකරු සමග පැමිණීම, ඇතුළත්වීමේ ගාස්තුව රුඃ 500කි. බඳවා ගන්නා කාල සීමාව 2022 මාර්තු 20 දින සිට 30 දක්වා, පුහුණුව සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා මාස 6 ක පුහුණුවක්, පුහුණුවෙන් පසු සහතිකයක් පිරිනැමේ. පාඨමාලා ලෙස තොරතුරු තාක්ෂණය/වෙල්ඩින් කර්මාන්තය, ජල නළ ශිල්පය/තිරරෙදි හා මෝස්තර නිර්මාණ ඉහත තොරතුරු අතුළත් කර ප්‍රදේශයේ තරුණ තරුණියන් දැනුවත් කිරීමට සුදුසු අත්පත්‍රිකාවක් සකස් කරන්න.

නැතහොත්,

රැකියා විරහිත තරුණ තරුණියන් උදෙසා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතු බව ද ඒ සඳහා ගොඩනැගිල්ලක් ඉදිකළ යුතු බව ද දඹුල්ල ස්වර්ණපුර දිමුතු යෞවන සමාජයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී තීරණය කෙරිණි. යෞවන සමාජයේ ලේකම් දිලීප හේරත් ඔබයැයි සිතා ස්වයං රැකියා මධ්‍යස්ථානය පරණ සතිපොළ භූමියේ ඉදිකිරීම සඳහා අවසර ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

(ලකුණු 15යි)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## දෙවන වාර පරීක්ෂණය 2021
## Second Term Test

**11 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** | **පැය දෙකයි**

**මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**

---

01. (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i). මේ සියල්ල හැරදා මම
ආවෙමි වලටා
වෙසෙන ලෙසා ඔබ පිය මා
සමිඳුන් සමඟා

(අ) මෙම පාඨය ඇතුළත් වන නාට්‍යයේ නම කුමක්ද?
(ආ) මෙහි " මම"යනුවෙන් හැඳින්වෙන්නේ කවුද?

(ii) (අ) පන්සිය පනස් ජාතකපොතේ දැකිය හැකි එක් ලක්ෂණයක් ලියන්න.
(ආ) පන්සිය පනස් ජාතක පොත රචිත යුගයේ සිටි රජතුමා නම් කරන්න.

(iii). "වහන්සේ මට දැයැවි රජ කෙනෙක් ඇත්තා හු නොවෙති"
(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන්ද?
(ආ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

(iv) කන් කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන්රසු දැල් කොලහල වන බියෙනේ
සන් සල නොව එහි පිළිරු ලෙසිනේ
.......................................................................................

(අ) සතරවන පද්‍ය පාඨය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍යයේ සඳහන් කාව්‍යාලංකාරය කුමක්ද?

(v). "ගමේ අනික් ගැහැනුන්ට මෙන් ඇට කැලය මැද තනිව යන්ට බියක් නො දැනිණ"
(අ) මෙම පාඨය ඇතුළත් වන කෘතියේ නම කුමක්ද?
(ආ) "ඇට" යන්නෙන් හැඳින්වෙන්නේ කවුද?

(vi)." රජගහ නුවර උපන් වැඩි නුවර නොවේ දැයි ලැජ්ජාවෙන් වළහාත් නොපියා ඊටත් අවුත් "
(අ) මෙසේ සිතුවේ කවුද?
(ආ) රජගහනුවරට පැමිණීමේ අරමුණ කුමක්ද?

(vii). නුදුරු වැ සිහිලැ ' ලී ය ගඟු ලැ ' ලිය
වට සැදි මල් වැ ලී ය සුදු වැලිය
පිපි වත සිටි ම ලී ය වත මලිය
තුටු වත සිති වී ලී ය පුල් විලිය

(අ). මෙම කවිය උපුටා ගත් ග්‍රන්ථයේ නම කුමක්ද?
(ආ). එම ග්‍රන්ථය රචනා කළ කතුවරයාගේ වෙනත් කෘති දෙකක් නම් කරන්න.

(viii) (අ) එච්.එම්. කුඩලිගම කවියාගේ කාව්‍ය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
(ආ). අතීත මුතුන් මිත්තන් විවේකය දැනුවත්කමින් හා විනෝදයෙන් ගත කිරීම සඳහා කී කවි වර්ගය කුමක්ද?

(ix). ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
උඹයි මගේ පුතා උතුම්

(අ). කවියා සඳහන් කරන පරිදි ගුරුවරයෙකු සතුවිය යුතු හොඳ ගුණාංගයක් ලියන්න.
(ආ) එස්. මහින්ද හිමිගේ කාව්‍ය කෘති දෙකක් නම් කරන්න.

(x) එල්ල වෙන්ට කවි කර කීවෙමි බොහොම
තොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම

.....................................................................................

නිල්ල අඹති සත් දවසින් බැලුවාම

(අ) මෙම කවියේ තුන්වෙනි පදය සම්පූර්ණ කරන්න.

(ආ) මෙම කවිය අයත් වන ජන කවි වර්ගය නම් කරන්න. (ලකුණු 2x10 =20යි)

(02.) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i). ම හ නි ල මි න් සිටි නා දොඹ නී **පියල**

පි ය ස ල මි න් මලගෙහි කෙළෑ රොනින්'වල

ත තු ඩ ල මි න් බිඳෑ **බිලිකුන්** මියුරු පල

ඉ සි ඹු ල මි න් යෙහි සැළ ! දඹ පඳුරුවල

(අ) **තද කළු අකුරින් මුද්‍රිත** පදවල අර්ථ දක්වන්න.

(ආ) මෙහි සඳහන් මාර්ගය අලංකාර වී ඇත්තේ කෙසේද?

(ii) "සිංහ නාද ඇසූ **මුව පොල්ලන්** පරිද්දෙන් තොපගේ අභීත ශබ්දයෙන්ම උන් භය ගන්වා **යමුගුරු** බාලා සියලු රා මස් පිරූ සැළවල් බිඳ තු තු කොට පියා වහා රා මස් අවුළු විසුරුවා නො කැ හැකි පරිද්දෙන් කොට"

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

(ආ) මෙම සිදුවීම හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) "ම දුව විකුණන්නා නැත.රන් හැර ගෙන නොදෙමි. අපටත් රක්ෂාව නම් ඌ ම වෙ ද? නො ලදොත් මියෙත් නම් මිය ප්‍රයෝජන කිම්ද? අප හා එක් වන්නා ම දුව පාවා දෙමි 'යි."

(අ) විද්දත් දියණියගේ පියා සතු විශිෂ්ට ගුණාංග දෙකක් ලියන්න.

(ආ) සමස්ත පාඨයේ තේරුම ලියන්න.

(iv) **වර වෙණ** නද අසමින් සිත සතොසිනි

සර හැර සියොතුන් පියපත් බිඳමිනි

**පුර ඔර** වසමින් සිටි රහ කුම් වැනි

සුර සෙනහට සුරසුන් පැන වු වැනි

(අ) **තද කළු අකුරින් මුද්‍රිත** පදවල අර්ථ දක්වන්න.

(ආ) කවියේ සඳහන් උපමාව හා උපමේය වෙන්කර දක්වන්න.

(v) "මහරජ තොප ගෙ රට අඟුල්මල් නම් සොරෙකැ, දරුණු, ලෙමුඬු අත් ඇත්තේ යැ , සතුන් කෙරෙහි කුළුණු නැත්තේ යැ , ගම් නොගම් කෙළෙ"

(අ) අංගුලිමාලගේ දාමරික බව කියැවෙන කරුණු දෙකක් ලියන්න.

(ආ) මෙම සිදුවීමට පෙර සිදුවු සිදුවීම කුමක්ද? (ලකුණු 4x5 =20යි)

(03) (i) අවස්ථා හා සිද්ධි නිරූපනයක්,

(ii) භාෂා ව්‍යවහාරයේ සුවිශේෂී ලක්ෂණයක් ........ "අඟුල් මල් දමනය" කතාවේ සාර්ථකත්වයට හේතු වී ඇත.එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i)ස්වභාව සෞන්දර්යය වර්ණනයක්,

(ii)බෞද්ධ ආගමික නැඹුරුවත් වර්ණනා කිරිමට හංස සංදේශ කතුවරයා සමත් වී ඇත්තේ කෙසේදැ'යි "කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට" පද්‍ය පන්තිය ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙකබැගින් ඉදිරිපත් කරමින් විමසන්න.

(ලකුණු4x5=20යි)

(04) (i) අජීවී පරිසරය සජීවිකරණයටත්,

(ii) විවිධ කාව්‍යෝපක්‍රම භාවිතයක් නිසා ගංගාවේ සංගීතය පද්‍ය පන්තිය අර්ථවත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

(i).ගමේ පරිහානියක්,

(ii). ගම්වැසියන්ගේ දිළිඳු භාවයත් මනාව නිරූපනය කිරිමට බැද්දේගම නවකතාකරුවා සමත් වී ඇත්තේ කෙසේදැයි නියමිත කොටස ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඉදිරිරිපත් කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

(05)." ජීවිතාදර්ශ මගින් සමාජය සුචරිතවත් කිරිමට සමතෙකි ජන කවියා" හානා හීය පානා අඩහැරෙන් දැනේ "පද්‍ය ආශ්‍රයෙන් නිදසුන් **තුනක්** ඉදිරිපත් කරමින් විස්තර කරන්න.

(06) බුද්ධියෙන් හා ස්ථානෝචිත ප්‍රඥාවෙන් අභියෝගජය ගත හැකි බව මහෞෂධ චරිතයෙන් නිරූපනය වේ.සුදුසු උදාහරණ **තුනක්** ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි)

(07).මව්පියන් හා දූ දරුවන් අතර ඇති දැඩි බැඳිම විවරණය කිරිමට ලෙන අතහැර යාම කතුවරයා සමත් වී ඇත්තේ කෙසේදැයි උචිත උදාහරණ **තුනක්** ඉදිරිපත් කරමින් විමසන්න. (ලකුණු 10යි)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Department of Education, Southern Province Department of Educ

දෙවන වාර පරීක්ෂණය 2021
Second Term Test

11 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I පිළිතුරු හා ළකුණු දීමේ ක්‍රමය.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | - | 2 | 11. | - | 4 | 21. | - | 2 | 31. | - | 2 |
| 02. | - | 3 | 12. | - | 1 | 22. | - | 3 | 32. | - | 4 |
| 03. | - | 1 | 13. | - | 2 | 23. | - | 4 | 33. | - | 3 |
| 04. | - | 2 | 14. | - | 3 | 24. | - | 3 | 34. | - | 4 |
| 05. | - | 4 | 15. | - | 3 | 25. | - | 2 | 35. | - | 1 |
| 06. | - | 3 | 16. | - | 1 | 26. | - | 4 | 36. | - | 1 |
| 07. | - | 4 | 17. | - | 2 | 27. | - | 1 | 37. | - | 2 |
| 08. | - | 1 | 18. | - | 3 | 28. | - | 4 | 38. | - | 3 |
| 09. | - | 2 | 19. | - | 1 | 29. | - | 4 | 39. | - | 1 |
| 10. | - | 3 | 20. | - | 4 | 30. | - | 1 | 40. | - | 2 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II පිළිතුරු හා ළකුණු දීමේ ක්‍රමය.

01. I (අ) කෙටි ඇදය /දීර්ඝ පාපිල්ල

(ආ) කෙටි පාපිල්ල / දීර්ඝ ඉස්පිල්ල

II. (ආ) මහලු + ආ (ආ) පහන් + අ

III. ශ, ෂ, ෂ, හ,ෆ,(අ)ඃ

IV. අනු, උප, අ

V. (අ) නිහතමානී (ආ) අරුණාලෝකය

VI. (අ) කම්කරුවෝ වැඩ කරති.

(ආ) අපි පිට්ටනියේ තණ කන එළදෙනක දැක්කෙමු.

VII. (අ) විධි ක්‍රියා (ආ) ආශිර්වාද ක්‍රියා

VIII. (අ) දැවුරුදු - ස්වරාදේශ සන්ධිය.

(ආ) වක්කඩ - පරරූප සන්ධිය.

IX. (අ) අව්‍යය සමාසය (ආ) විභක්ති සමාසය(සම්ප්‍රදාන විභක්ති සමාස)

X. (අ) සම්ප්‍රදාන විභක්තිය. (ආ) ආලපන විභක්තිය.

02. ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි.

01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08යි.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි.

03. ශිල්පීය දක්‍ෂතා සහ ඡේද බෙදා ලිවීම. - ලකුණු 05 යි.

01. සාරවත්භාවය - ලකුණු 07යි

විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම. - ලකුණු 01යි

තේමාව අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගතයුතුවේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.

මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්‍ෂතා සහ ඡේද බෙදා ලිවීම. - ලකුණු 05 යි.

වියරණ අත් අකුරු, විරාම ලක්‍ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම. පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතුවේ.

03. - කණිෂ්ක රජතුමාගේ අනුග්‍රහයෙන් ධර්ම ග්‍රන්ථ ශිලා මංජුසාවල අසුරා තමා විසින් සැදූ ස්තූපයක නිදන් කරන ලදි.

- තම දේශ සීමාවෙහි සෑම නගරයක ම මහා ස්තූප හා ආරාම ඉදිකර ඇත.
- ධර්ම ශාස්ත්‍රීය සේවයේ නිරත වූවන්ට රාජානුග්‍රහය ලබාදීම නිසා විවිධ පඬිවරු බුදු දහම ඇසුරින් වටිනා කෘති රචනා කළහ.
- බුදු පිළිමය ප්‍රථම වතාවට ලොවට බිහිවන්නේ මෙම රජු සමයේ ය.
- මධ්‍යම හා පෙරදිග ආසියාතික රාජ්‍යයන්ට බුදුදහම හඳුන්වාදී භාරතයේ මධ්‍ය දේශයේ සිට මධ්‍ය ආසියාව තෙක් ප්‍රචාරය කිරීමට කටයුතු කර ඇත.

04. (i) දෙපද කාව්‍ය ආකෘතිය

සිව්පද ආකෘතිය

(ii) නිදහස් කාව්‍ය ආකෘතිය

නිසඳැස් කාව්‍ය ආකෘතිය

(iii) ශබ්දාලංකාර ලෙස,

(iv) භාෂාව

(v) කවිය යනු හොඳ ම වචන හොඳ ම පිළිවෙළට යෙදීමයි.

5. අත්පත්‍රිකාව :-

(1) ආකෘතිය - ලකුණු 05 යි.

(2) අන්තර්ගතය - ලකුණු 07 යි.

(3) ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි. (මුළු ලකුණු 15 යි)

**නැතහොත්,**

රාජකාරී ලිපිය :-

(1) ආකෘතිය - ලකුණු 05 යි.

(2) අන්තර්ගතය - ලකුණු 07 යි.

(3) ශිල්පීය දක්ෂතා - ලකුණු 03 (මුළු ලකුණු 15 යි)111

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III පිළිතුරු හා ලකුණු දීමේ ක්‍රමය.

(01 )

I. (අ) සිංහබාහු

(ආ) සුප්පා දේවී

II. (අ) ගාථා ස්වල්පයක් දක්නට ලැබීම.

ගාථාවල අදහස් හා විස්තර නොමැති වීම.

අතීත කතාව අඛණ්ඩව ඉදිරිපත් කිරීම.

(ආ) හතරවෙනි පණ්ඩිත පරාක්‍රමබාහු රජු

III. (අ) කොසොල් රජතුමා

(ආ) ගුරුළුගෝමී පඬිවරයා

IV. (අ) තත් හය සෙත් සිටියෝ සිටි මතිනෝ

(ආ) උපමාලංකාරය

V. (අ) බැද්දේගම නවකතාව

(ආ) පුංචිමැණිකා

VI. (අ) උග්ගසේන සිටුපුත්‍රයා

(ආ) උගත් ශිල්පය දැක්වීමට ( ශිල්ප ප්‍රදර්ශනයට)

VII. (අ) හංස සන්දේශය

(ආ) බුදුගුණාලංකාරය , ලෝවැඩ සඟරාව , දහම් ගැට මාලාව , එළු අත්තනගලු වංශය , කව් ලකුණු මිණි මල

VIII. (අ) ඇ , කුණාටුව , එකෝමත් එක රටක , සංවාදය

(ආ) තේරවිලි කවි

IX. (අ) යුතුකම් ඉටු කිරීම , ගැරහුම් හමුවේ ඉවසීම

(ආ) නිදහසේ මන්ත්‍රය , නිදහසේ දැහැන , කව්මිණ , කව්මුතු ළමා කවි කළඹ

X. (අ) ගොල්ල සමඟ එති ඌරෝ හැමදාම

(ආ) කුරක්කන් කවි

(02)

I. (අ) මොර

ඉදුණු

(ආ) නා ගස් , දොඹ , බකිණි හා මොර ගස් වලින් මාර්ගය දෙපස අලංකාර වී ඇති අතර එම ගස්වල පිපුණු මල්වල මී මැස්සන් පියා සලමින් රොන් ගැනීම නිසා

II. (අ) මුව පැටව්

යකඩ පොලු

(ආ) කේවට්ටයා හා බ්‍රහ්මදත්ත රජු විෂ මත්පැන් යොදා එක්සියයක් රජ දරුවන් මැරවීමට සංවිධානය කළ ජය පැන් පානෝත්සවය විනාශ කරලීමට මහෞෂධ පඬිතුමා තම යෝධයන් දහසට උපදෙස් දෙන අවස්ථාව

III. (අ) දරුවන් මුදලට නොවිකිණීම

මැරෙන්න යන ජීවිතයක් ජීවත් කරවීමට සිතීම.

ජීවිතයක වටිනාකම හඳුනා ගැනීම

(ආ) මගේ දුව විකුණන්නේ නෑ. රත්තරන්වලටවත් ඇය නොදෙමි. අපවත් රක්ෂා කරන්නේ ඇය නොවේද ? ඇය ලැබුනොත් මැරෙනවා නම් මිය යාමෙන් ප්‍රයෝජන නැති නිසා අප සමඟ එකතු වුවහොත් දුව විවාහ කර දෙන්නම්.

IV. (අ) උතුම් / විශිෂ්ට

පුරයේ අහස / නගරයේ අහස

(ආ) උපමාව - දිව්‍ය සේනාවට දිව්‍ය ආසන පැනවීම

උපමේය - පක්ෂීන් අහස පුරා පියාපත් විදහාගෙන සිටීම.

V. (අ) හොරෙක් , දරුණුයි , ලේ මිශ්‍ර වුණු අත් සහිත , සතුන්ට කරුණාවක් නැති

(ආ) මන්තාණි බැමිණිය අඟුල්මල් පුතු සොයා වනයට යාමත් එය දිවසින් දුටු බුදුන් වනයට වැඩම වා අංගුලිමාල දමනය කරගෙන දෙව්රම් වෙහෙරට රැගෙන ඒම.

( ලකුණු 5X4 = 20 යි )

(03) උදාහරණ (උද්ධෘත) හතරට (ලකුණු 04 යි )

ප්‍රශ්නයට අදාළ ප්‍රමාණවත් විස්තර විචාරයට (ලකුණු 11 යි )

(04) උදාහරණ (උද්ධෘත) හතරට (ලකුණු 04 යි )

ප්‍රශ්නයට අදාළ ප්‍රමාණවත් විස්තර විචාරයට (ලකුණු 11 යි )

(05)
(06)
(07)

උදාහරණ (උද්ධෘත) තුනට (ලකුණු 03 යි )

ප්‍රශ්නයට අදාළ ප්‍රමාණවත් විස්තර විචාරයට (ලකුණු 07 යි )